කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II | කාලය පැය 02 යි

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව 1 කොටසෙන් ප්‍රශ්න දෙකක් ද 11 කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු වන චරිත් 2018.01.01 දින නැවුම් පළතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එදින ඔහු සතු රු. 200000 ක් වටිනා කඩ කාමරය ද රු. 50000 ක් වටිනා ශීතකරණය ද මුදලින් රු. 100000 ක් ද ව්‍යාපාරයට යෙදවීය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලයක් සේවය කල චරිත්ගේ සොහොයුරා වන චමත් ද 2018.01.10 දින රු. 50 000 ක ප්‍රාග්ධනයක් යොදා මෙම ව්‍යාපාරයට සම්බන්ධ විය. එදිනම ''රුහුණු ෆ්‍රෙෂ් ෆෘට් ''නමින් මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ අතර ව්‍යාපාරයට පළපුරුදු සේවකයෙකු ද බඳවා ගන්නා ලදී.

2018 ජනවාරි මාසය තුලදී පහත ගනුදෙනු සිදු විය.

| දිනය | ගනුදෙනුව | වටිනාකම |
|---|---|---|
| 2018.01.02 | පළතුරු මිලට ගැනුම් | රු.10 000 |
| 2018.01.03 | බැංකු ණය ලබා ගැනීම | රු.50 000 |
| 2018.01.08 | පළතුරු විකුණුම් | රු.20 000 |
| 2018.01.09 | පළතුරු මිලට ගැනුම් | රු.30 000 |
| 2018.01.10 | චමත්ගේ ප්‍රාග්ධනය ලැබීම් | රු.50 000 |
| 2018.01.15 | පළතුරු විකුණුම් | රු.50 000 |
| 2018.01.20 | ප්‍රවාහන ගාස්තු | රු. 5 000 |
| 2018.01.23 | සේවක වැටුප් | රු.10 000 |
| 2018.01.25 | පළතුරු ණයට විකුණුම් | රු. 5 000 |

2018.01.03 දින ලබා ගන්නා ලද බැංකු ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය 12 % වන අතර 2017.01.31 දිනට පළතුරු කිසිවක් ඉතිරි නොවීය.

(i) අ) 2018.01.01 දින චරිත් ආරම්භ කළ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ද?
ආ) අරමුණු අනුව වර්ග කළහොත් එම ව්‍යාපාරය අයත් වන්නේ කුමන වර්ගයකටද?

(ii) අ) ''රුහුණු ෆ්‍රෙෂ් ෆෘට් '' ව්‍යාපාරය ලියාපදිංචියට අදාළ පනත නම් කරන්න.
ආ) චරිත් ආරම්භ කළ ව්‍යාපාරයට සාපේක්ෂව ''රුහුණු ෆ්‍රෙෂ් ෆෘට් '' ව්‍යාපාරයේ දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න.

(iii) අ) ''රුහුණු ෆ්‍රෙෂ් ෆෘට් '' ව්‍යාපාරයේ ශක්තීන් 02 ක් නම් කරන්න.
ආ) මෙම ව්‍යාපාරයට අනාගතයේදී ඇතිවිය හැකි තර්ජන 02 ක් ලියන්න.

(iv) අ) ඉහත ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශව 02 ක් ලියන්න.
ආ) එම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන සිද්ධියේ සඳහන් පාර්ශවයක් සඳහන් කර එම පාර්ශවය ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුවක් ලියන්න.

(v) අ) 2018.01.01 දිනට චරිත්ගේ ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

(vi) අ) ඉහත සිද්ධියේ සඳහන් වන ජංගම වත්කමක් හා ජංගම නොවන වගකීමක් ලියා දක්වන්න.

ආ) 2018.01.31 දිනට ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කම්වල වටිනාකම කොපමණ ද?

(vii) අ) පළතුරු මිලදී ගැනීමට අදාළ ද්විත්ව සටහන අගයන් සහිතව දක්වන්න.

ආ) චමත් රු. 50000 ක ප්‍රාග්ධනය යෙදීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(viii) අ) ව්‍යාපාරය ජනවාරි මාසයේ ගෙවිය යුතු බැංකු ණය පොළිය කොපමණ ද?

ආ) එය ගිණුම්ගත කර දක්වන්න.

(ix) අ) ඉහත සිද්ධියේ සඳහන් වත්කමක් හා වගකීමක් වැඩිවීමට බලපාන ගණුදෙණුවක් ලියන්න.

ආ) "රුහුණු ෆ්‍රෙෂ් පෘට් " ව්‍යාපාරය භාවිත කරන මූලාශ්‍ර ලේඛණ 02 ක් නම් කරන්න.

(x) 2018.01.31 දිනට මුදල් පොත පිළියෙල කර අවසාන ශේෂය ගණනය කරන්න.

(ලකුණු 2 x10 = 20)

## 1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

(02) (i) අ) මිනිස් අවශ්‍යතා කෙටියෙන් හඳුන්වන්න.

ආ) මූලික මිනිස් අවශ්‍යතා 02 ක් නම් කර එම එක් එක් අවශ්‍යතාව සපුරාගන්නා ආකාර දෙක බැගින් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) වුවමනා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිය.

ආ) සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ ලාභ ඉපැයීමේ අපේක්ෂාවෙනි.

ඉ) නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ලෙස වර්ග කර දක්වයි.

ඊ) සිල්ලර වෙළඳ ව්‍යාපාර සේවා සැපයීමේ ව්‍යාපාරයකට නිදසුනකි.

(iii) කලාත්මක ලී බඩු නිෂ්පාදනයේ නිරත **"වුඩ් ආර්ට්"** ව්‍යාපාරයේ භාවිත කෙරෙන නිෂ්පාදන සම්පත් ලැයිස්තුවක් පහත දැක්වේ.

| | |
|---|---|
| උපකරණ | කර්මාන්ත ශාලා පරිශ්‍රය |
| දැව | මුදල් |
| අත් උදව්කරු | අයිතිකරුගේ නිර්මාණශීලීත්වය |

අ) මෙම සම්පත් භූමිය , ශ්‍රමය , ප්‍රාග්ධනය . ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක යටතේ වර්ග කර දක්වන්න.

ආ)ඉහත ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් පාර්ශව දෙකක් ලියන්න.

(iv) රසික වී ගොවීන්ගෙන් වී මිලදී ගෙන සේවකයන් දෙදෙනෙකුගේ ද සහය ඇතිව සහල් සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

අ)රසික හැරුණු විට මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

ආ)එම පාර්ශව ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතු දෙක බැගින් ලියන්න.

(ලකුණු 2 x4 = 8)

(03) (i) අ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?

ආ)ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) ව්‍යාපාරයක් සතු සුවිශේෂී නිෂ්පාදන ක්‍රම එම ව්‍යාපාරයට ශක්තියකි.

ආ)ව්‍යාපාරවලට අරමුදල් යොදවමින් අවදානම් දරණ පුද්ගලයන් කළමනාකරුවන් ලෙස හඳුන්වයි.

ඉ) සමුපකාර සමිති පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධානයකි.

ඊ) ජාතික නිෂ්පාදනය වර්ධනය කර ගැනීම , රජය ව්‍යාපාර තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණකි.

(iii) අ) ආර්ථික පරිසරයට අයත් සාධකයක් වන ''උද්ධමනය'' කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ)දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් ඇති කෙරෙන හිතකර බලපෑම් දෙකක් ලියන්න.

(iv) පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයක ජීවත් වන සිසිර මහජන බැංකුවෙන් ණය මුදලක් ද ලබාගෙන **''ශ්‍රී ලක් පිරිසිදු පොල්තෙල් ''** නමින් පොල්තෙල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

අ) ඉහත සිද්ධියේ සඳහන් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියන්න.

ආ)"නිෂ්පාදිතයේ ස්වභාවය අනුව **''ශ්‍රී ලක් පිරිසිදු පොල්තෙල්''** ව්‍යාපාරය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි'' ඔබ මෙම ප්‍රකාශයට එකඟවන්නේ ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 2 x4 = 8)

(04) (i) අ) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව බෙදා දක්වන්න.

ආ) ඉහත දැක්වෙන වර්ගීකරණයේදී සලකා බැලෙන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් ලියන්න.

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

අ) අයිතිකරුගේ වගකීම අසීමිත වීම ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියකි.

ආ)හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව තීරණය කර ඇත්තේ 2007 අංක 7 දරණ සමාගම් පනත මගිනි.

ඉ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය රාජ්‍ය සංස්ථා යටතට අයත් ය.

ඊ) සමුපකාර සමිතියක් ආරම්භ කිරීමට අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව 10 කි.

(iii) අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න.

ආ)ඒකපුද්ගල ව්‍යාපාර සංවිධානවල දැකිය නොහැකි හවුල් ව්‍යාපාරවල ඇති අවාසි දෙකක් ලියන්න.

(iv) දිලිනි සහ රුවිනි සමාන ප්‍රාග්ධනයක් යොදා "දිල් රූ" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය සීමිත වගකීමක් සහිතව වඩා ස්ථාවරත්වයකින් යුත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයකට පරිවර්තනය කිරීමට ඔවුන් අපේක්ෂා කරයි.

අ) "දිල් රූ" ව්‍යාපාර නාමය ලියාපදිංචි කළයුතු වන්නේ කුමන නෛතික ලේඛනයක් යටතේ කිනම් ආයතනයකටද?

ආ)දිලිනි සහ රුවිනි ගේ අපේක්ෂාවට අනුව මෙම ව්‍යාපාරය පුළුල් කිරීමට උචිත ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්ද?

(ලකුණු 2 x4 = 8)

## 11 කොටස - ගිණුම්කරණය

( ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

(05) (i) අ) ගිණුම්කරණයේ අරමුණු දෙකක් ලියන්න.

ආ) පහත සඳහන් සමීකරණයෙහි හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කර නැවත ලියන්න.

ලාභය = .................................... - ..................................... (ලකුණු 02)

(ii) අ) ජංගම වගකීම් සඳහා නිදසුන් දෙකක් ලියන්න.

ආ) වත්කම්වල දැකිය හැකි ලක්ෂණයක් ලියන්න. (ලකුණු 02)

(iii) සජිත් පවත්වාගෙන යන ජංගම දුරකථන අලෙවි කිරීමේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය වශයෙන් රු. 50 000 ක් යෙදවීම.
2. ව්‍යාපාරයේ ණයහිමියන්ට රු. 25 000 ක් ගෙවීම.
3. රු. 10 000 ක ජංගම දුරකථන තොගයක් ණය පදනම මත ගැනීම.
4. රක්ෂණ ගාස්තු සඳහා රු. 8 000 ක් ගෙවීම.
5. රු. 40 000 ක සේවා ආදායමක් ලැබීම.

අවශ්‍ය වන්නේ,

අ)ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
( පිළිතුරු සැපයීමේදී පහත සඳහන් ආකෘතිය භාවිත කරන්න).

| 2018.01.01 දිනට ශේෂය / ගනුදෙනු අංකය | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| | 60 000 | | 50 000 | | 10 000 |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| . | | | | | |

ආ) සතිය තුළ මුළු වත්කම් , වගකීම් හා මුළු හිමිකම්වල අඩුවීම හෝ වැඩිවීම වෙන් වශයෙන් දක්වන්න.
(ලකුණු 04)

(iv) අහිංසගේ ව්‍යාපාරයේ 2017 වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය (2017.01.01 දිනට) | 435 000 |
| වර්ෂයේ වියදම් | 155 000 |
| වර්ෂයේ ආදායම් | 250 000 |
| මාර්තු 31 දින අයිතිකරු යෙදවූ මුදල | 125 000 |

අවශ්‍ය වන්නේ,

අ) 2017.12.31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(06) (i) අ) මූලාශ්‍ර ලේඛනවල ප්‍රයෝජන දෙකක් ලියන්න.

ආ)බැංකු ගිණුමේ ගණුදෙණු සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛන දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ලෙජරය කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 02)

(iii) අ) ගිණුමක ශේෂය ලෙස කුමක් අදහස්වේද?

ආ) ගිණුම් වර්ග දෙකකට නිදසුන් දක්වන්න

(ලකුණු 02)

(iv) 2018.01.01 දින හේමාල් විසින් ආරම්භ කළ සිල්ලර බඩු ව්‍යාපාරයේ ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

2018.01.01 රු.100 000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
01.02 අත්පිට ගැණුම් රු. 60 000
01.05 බැංකු ණයක් ගත්තා රු. 50 000
01.10 කාර්යාල උපකරණ තොගයක් මිලදී ගැනීම රු. 15 000
01.18 කඩ කුලී ගෙව්වා රු. 8 000
01.18 විකුණුම් රු. 50 000
01.22 කොමිස් ආදායම් ලැබීම් රු. 10 000
01.28 බැංකු ණයෙන් කොටසක් පියවීම රු. 5 000

අවශ්‍ය වන්නේ,

(අ) මුදල් පොත පිළියෙල කර 2018.01.31 දිනට ශේෂය දැක්වීම. (ලකුණු 06)

(මුළු ලකුණු 12)

(07) (i) මිලදී ගත් භාණ්ඩයක ලකුණු කළ මිල රු. 30 000කි. භාණ්ඩය සඳහා අඩු කෙරෙන වෙළඳ වට්ටම 15% කි. වෙළඳ වට්ටම අඩු කළ පසු ශුද්ධ වටිනාකම කීයද? (ලකුණු 02)

(ii) අ) සුළු මුදල් අග්‍රිමය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(iii) හේෂාන්ගේ ව්‍යාපාරයේ 2018 අප්‍රේල් මාසයට අදාළව සුළු මුදල් භාරකරු විසින් පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 2018.04.01 | සුළු මුදල් අග්‍රිමය ලැබුණා | 2000 |
| 04.02 | බස් ගාස්තු | 100 |
| 04.04 | තැපැල් ගාස්තු | 50 |
| 04.06 | සංග්‍රහ වියදම් | 250 |
| 04.08 | ත්‍රිරෝද රථ ගාස්තු | 60 |
| 04.12 | කපිලට ගෙව්වා | 300 |
| 04.15 | ගෙන ඒමේ කුළී | 500 |
| 04.20 | පිරිසිදු කිරීම් | 200 |
| 04.24 | පෑන් සඳහා | 30 |
| 04.26 | මුද්දර සඳහා | 50 |

අවශ්‍ය වන්නේ,

අ) 2018.04.30 දිනට සුළු මුදල් පොත පිළියෙල කර 2018.05.01 දිනට අග්‍රිමය ප්‍රතිපූරණය කර පෙන්වන්න. ඒ සඳහා **තැපැල් වියදම්, ගමන් වියදම් , සංග්‍රහ වියදම් හා විවිධ වියදම්** ලෙස විශ්ලේෂණ තීරු භාවිත කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 12)